# මතුගම අධ්‍යාපන කලාපය

## විද්‍යා විෂය ඒකක සංවර්ධන වැඩසටහන

| 7 ශ්‍රේණිය | ශාක විවිධත්වය | ඒකකය - 01 |
|---|---|---|

**A කොටස**

- **සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අදින්න**

1). අපුෂ්ප ශාකයක් වනුයේ,

i. අඹ ii. පොල් iii. මඩු iv. කොස්

2). මුදුන් මූල පද්ධතියක් සහිත ශාකයකි.

i. ඉරිඟු ii. වී iii. මිරිස් iv. පොල්

3). සංචිත මුල් සහිත ශාකය වන්නේ,

i. නුග ii. කැරට් iii. කරපිංචා iv. ඉඟුරු

4). කරුමුල් හා කයිරු මුල් දරන ශාක කාණ්ඩය

i. නුග, රම්පේ ii. රම්පේ, ඕකිඩ් iii. කැරට්, බීට් iv. කිරල, නුග

5). වාතයේ ඇති ජල වාෂ්ප අවශෝෂණය කරනුයේ,

i. වායුධර මුල් මගිනි. ii. කයිරු මුල් මගිනි. iii. වායව මුල් මගිනි. iv. සංචිත මුල් මගිනි.

6). අතු නොබෙදුනු කඳක් සහිත ශාකයකි.

i. පේර ii. වද iii. රඹුටන් iv. වී

7). භූගත කඳක් දරන ශාකයක් වන්නේ,

i. බතල ii. මඤ්ඤොක්කා iii. අර්තාපල් iv. කඩල

8). පත්‍රයක කෘත්‍යයක් නොවනුයේ,

i. ආහාර නිෂ්පාදනය ii. ප්‍රජනනය iii. සන්ධාරණය iv. ජලය සංචිත කිරීම

9). පුෂ්පයක අඩංගු ප්‍රධාන කොටසක් නොවනුයේ,

i. මල්පැණි ii. මනිපත්‍ර iii. දලපත්‍ර iv. ජායාංගය/පුමංගය

10). නාගදරණ බීජය ව්‍යාප්ත වීම සිදුවන්නේ,

i. සුළඟ මගිනි ii. ජලය මගිනි iii. ස්ඵෝටනය මගිනි iv. සතුන් මගිනි

## B කොටස - රචනා

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. මල් පිපෙන හා මල් නොපිපෙන ලෙස ශාක ප්‍රධාන කාණ්ඩ 2 කි.
    a) සපුෂ්ප හා අපුෂ්ප ශාක දෙක බැගින් ලියන්න. (ලකුණු 04)
    b) සපුෂ්ප ශාකයක ප්‍රධාන කොටස් මොනවා ද? (ලකුණු 04)
    c) මුල්වල ප්‍රධාන කාර්යයන් 2ක් ලියන්න. (ලකුණු 02)

2. මුල් හා කඳ යනු ශාකයක ඇති ප්‍රධානතම කොටස් දෙකකි.
    a) නිදිකුම්බා ශාකයේ ඇති මුල්වලින් කෙරෙන විශේෂ කාර්යය කුමක් ද? (ලකුණු 02)
    b) භූගත කඳන් යනු මොනවා ද? (ලකුණු 02)
    c) වර්ධක ප්‍රජනනය සිදු කරන මුල්, ආහාර සංචිත කිරීම සිදු කරන මුල්, කඳ ඉහළට නැගීමට ආධාර කරන මුල් සහිත ශාක දෙක බැගින් ලියන්න. (ලකුණු 06)

3. ශාකයක සුවිශේෂී කාර්යයක් පත්‍ර මගින් ඉටු කරයි.
    a) ශාක පත්‍රයක ප්‍රධාන කාර්යය කුමක් ද? (ලකුණු 02)
    b) සංයුක්ත පත්‍රයක් යන්න හඳුන්වන්න. (ලකුණු 02)
    c) සරල පත්‍රයක රූප සටහනක් ඇඳ එහි ප්‍රධාන කොටස් නම් කරන්න. (ලකුණු 06)

4. පුෂ්ප යනු ශාකයක ඵල හටගන්නා ප්‍රධානතම අංගයකි.
    a) වද පුෂ්පයක බාහිරින් හඳුනා ගත හැකි ප්‍රධාන කොටස් මොනවා ද? (ලකුණු 02)
    b) පුමාංගය හා ජායාංගයට අයත් ප්‍රධාන කොටස් නම් කරන්න. (ලකුණු 02)
    c) පහත සඳහන් ඵල හෝ බීජ ව්‍යාප්ත වීම සඳහා ඇති විශේෂ හැඩ ගැසීම් එක බැගින් සඳහන් කරන්න.
        වරා, දිය කඳුරු, කජු (ලකුණු 04)
    d) ඒක බීජ පත්‍රී හා ද්වි බීජ පත්‍රී යන පදවල අර්ථය ලියන්න. (ලකුණු 02)